# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2465/12 - 2025 දෙසැම්බර් මස 03 වැනි බදාදා - 2025.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/GIK/4/4/2/43.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/18/2021/WS/407.

ගම්පොල, ඇත්ගාල ජල සම්පාදන ක්‍රමයේ ඇත්ගාල නළ ළිං පොම්පාගාරය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1076 - සිංහපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැනුම්පති විසින් මැන පිළියෙළ කරන ලද අංක 32079 (04) 01 දරන පිඹුරේ කැබැලි අංක 01 සඳහා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0025ක් වන ඉඩම් කොටස :

**01. කැබලි අංකය 01**

කැඩැස්තර සිතියම් අංකය: 320739 (04) 01; ඉඩමේ නම: මරියාවත්ත එස්ටේට් ඇත්ගාල ඩිවිෂන්; හිමිකම් කියන අයගේ විස්තර: බටපොල හේවගේ රංජිත් කුමාර, අංක 857, බංගලාව පාර, ඇත්ගාල, ගම්පොල; අත්පත් කරගත් ප්‍රමාණය: හෙක්. 0.0025.

මායිම්:

උතුර: මාර්ගය; නැගෙනහිර: මාර්ගය සහ බී. එච්. රංජිත් කුමාර හිමිකම් කියන මරියාවත්ත එස්ටේට් ඇත්ගාල ඩිවිෂන් (ටී. පී. 154796 කොටස); දකුණ: බී. එච්. රංජිත් කුමාර හිමිකම් කියන මරියාවත්ත එස්ටේට්, ඇත්ගාල ඩිවිෂන් (ටී. පී 154796 කොටස); බටහිර: බී. එච්. රංජිත් කුමාර හිමිකම් කියන මරියාවත්ත එස්ටේට්, ඇත්ගාල ඩිවිෂන් (ටී. පී 154796 කොටස) හා පාර

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025.12.29 වැනි දින **ප. ව. 2.00ට ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී** මා සම්මුඛ විය යුතුයි.

තවද, 2025.12.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එස්. එම්. සී. සමරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
ගඟඉහළ කෝරළේ.

2025 ක් වූ නොවැම්බර් මස 25 වැනි දින,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0012